# බැඳීම #7

| **කෘෂිකාර්මික තීරණ ගැනීමට සහය වීමේ සහ කෘෂි ව්‍යාපාර සඳහා සහය වීමේ පද්ධතියක් සමගින් ගොවියන් සවිබල ගැන්වීම** | |
|---|---|
| 2019 මාර්තු 01 – 2021 අගෝස්තු 31 | |
| ක්‍රියාත්මක කිරීමේ දී මූලික වන ආයතනය/ පුද්ගලයා | **කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය** |
| **බැඳීම පිළිබඳ විස්තරය** | |
| බැඳීම මඟින් අවධානයට ලක්කරන්නා වූ මහජන ගැටළුව කුමක්ද? | ඍතුමය කෘෂි නිෂ්පාදන උච්ඡාවචනයන් සහ මිල උච්ඡාවචනයන් ගොවියන්ගේ ආදායම කෙරේ පීඩාකාරී ලෙස බලපාන අතර එයට ප්‍රධානම හේතුව වන්නේ දැනටමත් වගා කර ඇති ප්‍රමාණයන්, නිර්දේශිත භෝග සහ ප්‍රභේදයන්, කෘෂි යෙදවුම් උපයෝජ්‍යතාවය, තාක්ෂණික උපයෝජ්‍යතාවය, උපදෙස් ලබාගැනීමට සම්බන්ධ කරගතයුතු නිලධාරියා ආදී ඍතුමය තොරතුරු දැනගැනීම සඳහා ඔවුනට පහසුකම් නොමැති වීමයි. මෙම අස්ථායී වාතාවරණය හේතුවෙන් ගොවියන් භෝග වගාවන්ගෙන් ඉවත්වීමට පෙලඹේ. හදිසි ආහාර ආනයනයේ දි සිදුවිය හැකි ප්‍රමාදයන් ජාතික/ කලාපීය ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි ද බලපායි |
| බැඳීම කුමක්ද? | මෙම බැඳීමෙහි අරමුණ වන්නේ ගොවියන් වෙනුවෙන් කෘෂිකර්මය සඳහා අවශ්‍ය සියළු තොරතුරු වෙත ප්‍රවේශ විමට හා කෘෂි ව්‍යාපාර සඳහා පහසුකම් සැලසිය හැකි තනි පද්ධතියක් ස්ථාපනය කර ඒ තුලින් කාලීන තීරණ ගැනීම සඳහා ගොවියන් සවිබල ගන්වා ඔවුන්ගේ ආදායම් වර්ධනය කිරීමය. මෙම තොරතුරු වෙත අන්තර්ජාලය සහ ජංගම දුරකථන මාර්ග ආදී විවිධ ක්‍රම ඔස්සේ ලඟාවිය හැක. |
| මෙම මහජන ගැටළුව විසඳීම සඳහා හඳුනාගත් බැඳීම දායක වන්නේ කෙසේද? | භෝග නිෂ්පාදනයේ දී ගොවියන් සඳහා සාධාරණ ආදායමක් සහ පාරිභොගිකයින් සඳහා දැරිය හැකි මිලක් සුරක්ෂිත වන පරිදි කෘෂි නිෂ්පාදන අතිරික්ත අවම කිරීමටත්, මිල උද්ධමනය අවම කිරීමටත් මෙම බැඳීම දායක වෙයි. මෙම විද්‍යුත් පද්ධතිය විසින් වෙනත් තොරතුරු පද්ධතීන් මගින් ලබා දෙන විසිරී ඇති කෘෂිකාර්මික තොරතුරු එක් පද්ධතියක් ලෙස එක් රැස් කර එවැනි තොරතුරු වෙත ගොවියන්, කෘෂිව්‍යාපාරික මෙහෙයවන්නන්, නිලධාරීන් සහ ප්‍රතිපත්ති සකසන්නන් හට ඇති ප්‍රවේශය වර්ධනය කෙරෙනු ඇත. කෘෂිකර්මය පදනම් කරගත් ඉල්ලුම් හා සැපයුම් සහ මිල තොරතුරු වෙත පහසු ප්‍රවේශයක් සැලසීම තුලින් කෘෂිකාර්මික අලෙවිකරණයෙහි ඇති අකාර්යක්ෂමතාවයන් අඩුවනු ඇත. මෙම බැඳීම ගොවියන් සඳහා පරිශීලක මිත්‍රශීලී ජංගම යෙදුම් සහයෙන් යුත් තොරතුරු ව්‍යාප්ත කිරීමේ උප පද්ධතියක් සහ මාර්ගගත දැන්වීම් උප පද්ධතියක් නම් වූ උප අංග 2ක් සහිත විද්‍යුත් පද්ධතියක් සපයනු ඇත. කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා පොදු වේදිකාවක් නිර්මාණය වනු ඇති අතර ඒ තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි අනෙකුත් ප්‍රධාන තොරතුරු පද්ධති මගින් උත්පාදනය කරනු ලබන භෝග අනාවැකි තොරතුරු, බීජ උපයෝජ්‍යතාවය, දේශගුණික හා කාලගුණික තොරතුරු, පළිබෝධක පරීක්ෂණ, පාංශු වාර්තා පද්ධති හා මිල තොරතුරු යනාදී වාර්තා සහ තොරතුරු අඩංගු වේ. දැනටමත් වගා කර ඇති ප්‍රමාණයන්, නිර්දේශිත භෝග සහ ප්‍රභේදයන්, කෘෂි යෙදවුම් උපයෝජ්‍යතාවය, තාක්ෂණික උපයෝජ්‍යතාවය, උපදෙස් ලබාගැනීමට සම්බන්ධ කරගතයුතු නිලධාරියා ආදී තොරතුරුද මෙම වේදිකාව මගින් සැපයේ. තවද, කෘෂිකාර්මික අලෙවිකරණයට සහය වීම සඳහා මාර්ගගත දැන්වීම් ක්‍රමයක් නිර්මාණය කරනු ලබන අතර ඇන්ඩ්‍රොයිඩ් යෙදවුමක් මගින් ගොවීන්ට ඒ වෙත ප්‍රවේශ වී දැන්විම් පළ කිරිමට හැකිවේ. |
| මෙම බැඳීම විවෘත රාජ්‍ය හවුල්කාරීත්ව අගයන්ට අදාළ වන්නේ ඇයි? | කෘෂිකාර්මික තොරතුරු කෙරේ ඇති ප්‍රවේශන හැකියාව විද්‍යුත් පද්ධතිය මගින් වර්ධනය බැවින් **තොරතුරු වෙත ප්‍රවේශය** යන විවෘත රාජ්‍ය හවුල්කාරීත්ව අගය මෙම බැඳීම මගින් වැඩිදියුණු කෙරේ. කෘෂිකාර්මික ඉල්ලුම් හා සැපයුම් සම්බන්ධ තොරතුරු ව්‍යාප්තිය සඳහා පහසුකම් සැලසීම හේතුවෙන් මෙම බැඳීම හරහා ගොවියන් සඳහා මිල තොරතුරු පිළිබඳ **විනිවිදභාවය** ප්‍රවර්ධනය කෙරේ. |
| අමතර විස්තර | හදිසි ආහාර ආනයනයන් සම්බන්ධයෙන් වෙළඳ කටයුතු සම්බන්ධ අමාත්‍යාංශයට තීරණ ගැනීම සඳහා මෙම බැඳීම මගින් පහසු වේ. එමෙන්ම, මෙමගින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ "අපි වවලයි අපි කන්නේ" යන කෘෂිකර්ම වැඩසටහනට දායක වීමටත්; තිරසර ශ්‍රී ලංකාවක්: දැක්ම සහ උපාය මාර්ගික ගමන් මග කෙටුම්පතෙහි සහ 2025 දැක්මෙහි දැක්වෙන නිර්දේශ සහ බැඳීම් ක්‍රියාත්මක කිරීමටත් මෙම බැඳීම සහය වේ. |

| බැඳීම සපුරාලීම සඳහා ඉලක්කගත ක්‍රියාකාරකම් | ආරම්භක දිනය | අවසන් දිනය |
|---|---|---|
| 1. ගොවියන් හට භෝග වගා සහ භෝග අනාවැකි තොරතුරු ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන් ක්‍රියාකාරී සහ යාවත්කාලීන දත්ත පද්ධති තිබීම. | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී | 2021 ජූනි |
| 2. භෝග නිර්දේශනය , බීජ උපයෝජ්‍යතාවය, තාක්ෂණික උපයෝජ්‍යතාවය සහ උපදෙස් හා වෙළඳපොල විස්තර ලබාගැනීමට සම්බන්ධ කරගතයුතු දේශීය නිලධාරියා පිළිබඳ තොරතුරු ආදිය ලබා ගැනීම සඳහා තීරණ ගැනීමේ සහායක මෙවලමක් ලෙස විද්‍යුත් කෘෂිකාර්මික පද්ධතියක් ස්ථාපනය කරනු ඇත. පවතින දත්ත පද්ධති යාවත්කාලීන කිරීම, ඒවා විද්‍යුත් කෘෂිකාර්මික පද්ධතිය හා සම්බන්ධ කිරීමට යෙදුම් ක්‍රමලේඛ අතුරු මුහුණත් නිර්මාණය කිරීම සහ අවශ්‍ය වන්නේ නම් නව දත්ත පද්ධති නිර්මාණය කිරීම. | 2019 මාර්තු | 2021 ජූනි |
| 3. වගාකරුවන් හට භෝග නිෂ්පාදන පිළිබඳව දෛනික මිල ලැයිස්තු ලබාගැනීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම | 2019 මාර්තු | 2021 ජූනි |
| 4. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම්බන්ධ කිරීම සඳහා සහ දේශීය සහ අන්තර්ජාතික කෘෂිකර්ම වෙළඳපොල ගවේෂණය කිරීමේ හැකියාව ඇති වෙබ්/ ජංගම යෙදවුමක් පදනම් කරගත් සේවාවක් නිර්මාණය කිරීම | 2019 මාර්තු | 2021 ජූනි |
| 5. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය සහ ධාරිතා වර්ධනය | 2019 මාර්තු | 2021 ජූනි |

**සම්බන්ධීකරණ තොරතුරු**

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කරන ආයතනයෙන් වගකිව යුතු පුද්ගලයාගේ නම | | එස් පෙරියසාමි මහතා |
| තනතුර, දෙපාර්තමේන්තුව | | අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) |
| විද්‍යුත් තැපැල් ලිපිනය සහ දුරකථන අංකය | | විද්‍යුත් තැපැල : periyasamy.doa@gmail.com<br>ස්ථාවර දුරකථනය : 081 2030040 |
| සම්බන්ධවන අනෙකුත් පාර්ශවයන් | රාජ්‍ය අංශයෙන් සම්බන්ධවන පාර්ශවයන් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව; ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව; පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව; ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය; හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (HARTI); තොරතුරු තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශය; තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA); ශ්‍රී ලංකා හදබිම අධිකාරිය |
| | සිවිල් සමාජයීය සංවිධාන, පුද්ගලික අංශය, බහුපාර්ශවීය අංශ හා අනෙකුත් ක්‍රියාකාරී කමිටු | අදාල සිවිල් සමාජයීය සංවිධාන |